# 42

# සාම්ප්‍රදායිකත්වය නූතනත්වය හා ගළපා කවියට ජීවය දුන් ලාල් හැගොඩගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනයක්

*ජයවර්ධන, ආර්. ඒ. ඩී. ටී. එස්.*[1]

කාව්‍ය මාධ්‍යයෙහි ලා සමකාලීන සමාජ දේශපාලන වාතාවරණය සියුම් ව ග්‍රහණයට ගනිමින් වඩාත් කලාත්මක අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා ලාල් හැගොඩ කවියා ගත් වැදගත් වෑයම පිළිබඳ සමස්තයක් ලෙස මෙහි දී අගය කෙරේ. මෙකී වෑයම කාව්‍ය කිහිපයක් මගින් ඓතිහාසික ව හා න්‍යායාත්මක ව හැදෑරීමට ලක් වේ. ඔහුගේ කවිය නූතනත්වය හා ගැළපීමේ දී සමාජය තුළ ජනතාවාදී දෘෂ්ටිය ප්‍රතික්ෂේප වීම දක්නට ලැබිණි. මේ අතර දේශපාලන සටන්පාඨ කවි බවට පරිවර්තනය වීම, තරුණයාගේ විප්ලවයට සානුකම්පිත හැඟීමක් එක් කළ කවි මෙන් ම කවියේ ස්වරූපය, ආකෘතිය ආදිය නව්‍යාකාරයෙන් දැකීමක් ද මෙකල ප්‍රවණතා ලෙස දක්නට ලැබේ. ලෝකයේ වේගවත්වීම්වලට සාපේක්ෂ ව ප්‍රකාශන මුහුණුවර වෙනස් කරමින් මනුෂ්‍යත්වය, සොබාදහම දෙස වඩාත් සියුම් ව දැකීමේ දෘෂ්ටියකින් පරිපූර්ණ වෙමින් හැගොඩගේ කලඑළි බැසීම තුළින් සිංහල කවියට අමුතු අත්දැකීමක් ලබා දෙමින් මිනිස් චින්තනයේ සියුම් දෘශ්‍ය රූප මවමින් මිනිස් චින්තනය ප්‍රකෘතිමත් කළේ ය. ලාල් හැගොඩගේ ප්‍රතිභාපූර්ණ කවිය හුදු සෞන්දර්යාත්මක රොමැන්තිකවාදී වෙමින් සැබෑ සමාජ ප්‍රශ්නවලින් වියුක්ත වූවක් නොවූ අතර සැබෑ සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කළේ ය. සෞන්දර්යාත්මක මානුෂීය අත්දැකීම් හරහා ගලා යන කාව්‍ය සංකල්පනා ඔහුගේ කෘති කිහිපයක් ඇසුරින් හා සමකාලීන කවීන්ගේ කෘති හා සසඳමින් විචාර මත හා අදහස් ගළපමින් වඩාත් කාව්‍යාත්මක දෘෂ්ටියකින් හැදෑරීම තුළින් ප්‍රත්‍යක්ෂ කෙරේ. කවිය නම් වූ සියුම් ප්‍රකාශනය තුළින් ගෙන ගිය දෘෂ්ටිවාදය අතික්‍රමණය කරමින් සැබෑ මනුෂ්‍යත්වය ස්වභාව ධර්මය හා ගළපමින් සැබෑ ජනතාවක් අරමුණු කරමින් මිනිසාගේ ඉරණම දේශපාලනයේ, ආර්ථිකයේ එසේ ම ස්වභාව ධර්මයාගේ ද ඵලයක් බව විශිෂ්ට අයුරින් පෙන්වා දීම විද්‍යමාන වේ.

ප්‍රමුඛ පදඃ සමාජ යථාර්ථය, සියුම් දෘශ්‍ය රූප, මනුෂ්‍යත්වය, ස්වභාව ධර්මය, ප්‍රතිභාපූර්ණ කවියා

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* sewjaya92@gmail.com